# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1796/21 - 2013 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2013.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන නිවේදනයයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 අධිකාරය) 10(සී) වගන්තියේ විධි විධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රෙගුලාසියකි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
මුදල් මණ්ඩලය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2013ක් වූ පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

මුදල් තැරැව්කරණ රෙගුලාසි

1. මෙම රෙගුලාසි, "2013 අංක 1 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි" යනුවෙන් හැඳින්විය යුතුය. මෙම රෙගුලාසි 2013 පෙබරවාරි මස 15 වැනි දින සිට බලපැවැත්වේ. — උධෘතය සහ වලංගු දිනය

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ (මින් පසුව "මහ බැංකුව" ලෙස හඳුන්වනු ලබන) මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ "බලය පැවරීමේ සහතිකය" යටතේ වූ අවසරයකින් තොරව, කිසියම් පුද්ගලයෙකු විසින් හෝ වෙනත් පුද්ගලයෙකු යොදවා හෝ මුදල් තැරැව්කරණ ව්‍යාපාර කටයුතු සිදු නොකළ යුතුය. — බලය පැවරීමේ සහතිකය

3. ඉහත 2 වැනි රෙගුලාසිය ප්‍රකාරව " බලය පැවරීමේ සහතිකය" අයදුම් කිරීමට සුදුසුකම් ලාභියෙකු වන්නේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි අවම ප්‍රාග්ධනය රුපියල් මිලියන දහයකට (රු. 10,000,000) සමාන හෝ මුදල් මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලබන එවැනි වෙනත් ප්‍රාග්ධන අවශ්‍යතාවයක් සපුරා ඇති, සීමාසහිත වගකීම් සහිත සමාගමක් පමණි. — අයදුම් කිරීම සඳහා සුදුසුකම්

4. බලය පැවරීමේ සහතිකය නිකුත් කිරීම පිළිබඳව සලකා බැලීම පිණිස අයදුම් කරන සමාගම විසින් : — අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීම

(අ) බලය පැවරීමේ සහතිකය අයදුම් කිරීම සඳහා මෙම රෙගුලාසිවලින් නිර්දේශිත ආකෘති පත්‍රයට අනුකූලව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් 6 වැනි රෙගුලාසියෙන් නිර්දේශිත අනෙකුත් ලිපි ලේඛණ ද සමග දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර ;


1A - G 017262 — 355 (2013/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඉහත 4(අ) වැනි රෙගුලාසියෙහි සඳහන් අයදුම් පත්‍රයෙන් සපයනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය අයදුම් කරන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා පත්‍රයක් මගින් තහවුරු කළ යුතුය.

සංක්‍රමික ක්‍රියාවලිය

5. (අ) මහ බැංකුව විසින් නිකුත් කර ඇති "නිර්-විරෝධතා ලිපිය" සහිතව මේ වන විටත් මුදල් තැරැව්කරණ ව්‍යාපාරයේ නියුතු ඕනෑම පුද්ගලයෙකු මෙම රෙගුලාසි බලපවත්වන දින සිට හෝ ඊට පසුව ද මුදල් තැරැව්කරණ ව්‍යාපාරයේ නියැලීමට කැමැත්තක් දක්වන්නේ නම් මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන "බලය පැවරීමේ සහතිකය" ලබා ගැනීම සඳහා මෙම රෙගුලාසි බලාත්මක වන දින සිට මාස තුනක් (03) ඇතුළත ඉහත 4 වැනි රෙගුලාසිය පරිදි අයදුම් පත්‍රයක් දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

(ආ) ඉහත 5(අ) වැනි රෙගුලාසියට අදාළ පුද්ගලයෙකුට මෙම රෙගුලාසිවල නිර්දේශ කරන ලද සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා මෙම රෙගුලාසි බලාත්මක වන දින සිට වසර එකක (01) කාලයක් හිමි වනු ඇත.

(ඇ) මහ බැංකුව විසින් දැනටමත් නිකුත් කරන ලද "නිර්-විරෝධතා ලිපි ", මෙම රෙගුලාසි බලපවත්වන දින සිට මාස තුනක් (03) ඉකුත් වීමෙන් පසු බල රහිත වේ. කෙසේ වුව ද, ඉහත 5(අ) වැනි රෙගුලාසියට අනුකූල පුද්ගලයෙකු නම් ඔහු සතු "නිර්-විරෝධතා ලිපි" පමණක්, මෙම රෙගුලාසි බලාත්මක වන දින සිට වසර එකක් (01) ඉක්ම යාමත් සමග බල රහිත වේ.

අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

6. "නිර්-විරෝධතා ලිපි " සහිතව දැනටමත් මුදල් තැරැව්කරණයෙහි නියුතු වූවන් ද ඇතුලුව "බලය පැවරීමේ සහිතකය" ලබාගැනීම සඳහා අයදුම් කරන සමාගම්, දේශීය කටයුතු අධ්‍යක්ෂ විසින් නිර්දේශිත ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය සමග, වෙනත් සඳහනක් නොමැති නම්, පහත සඳහන් ලිපි ලේඛණ/තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද සාංගමික ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය සහ පෝරම 20හි අනුපිටපත් ;

(ආ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද "නිර්-විරෝධතා ලිපිය " සහිතව මේ වන විටත් මුදල් තැරැව්කරණ ව්‍යාපාරයේ නියුතු පුද්ගලයෙකු හැර සුදුසුකම් ලාභී වෙනත් පුද්ගලයෙකු විසින් අයදුම් කිරීමේ දී, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අනුපිටපතක් ;

(ඇ) ප්‍රධාන විධායක නිලධරයා ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිලධරයන්ගේ සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ විදේශ ගමන් බලපත්‍ර අංක, පදවි නාම, පෞද්ගලික ලිපිනයන්, සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ තොරතුරු ;

(ඈ) ඩීඕඩී/එම්බී/002 පෝරමය අනුව ප්‍රධාන විධායක නිලධරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දිවුරුම් ප්‍රකාශන ;

(ඉ) සියලුම ප්‍රධාන කොටස් හිමියන්ගේ සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ විදේශ ගමන් බලපත්‍ර අංකය ;

(ඊ) සාංගමික ව්‍යවස්ථාවලියෙහි සඳහන් නොවන අවස්ථාවලදී, අයදුම් කරන සමාගමට මුදල් තැරැව්කරණයේ යෙදීමට බලය ලබා දී ඇති බව තහවුරු කරමින් ඉදිරිපත් කරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා පත්‍රය ;

(උ) සමාගම ස්වකීය අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා ඇති බවට ලේඛනගත සාක්ෂි ;

(ඌ) ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ අනුපිටපතක් ; සහ

(එ) දේශීය කටයුතු අධ්‍යක්ෂ විසින් විශේෂයෙන් නියම කරනු ලබන වෙනත් ඕනෑම කිසියම් තොරතුරක්.

සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය

7. මෙම රෙගුලාසි යටතේ "බලය පැවරීමේ සහතිකය" නිකුත් කිරීම සඳහා යෝග්‍යතාව නිශ්චය කිරීම පිණිස පවත්වනු ලබන ඕනෑම විමර්ශණයක දී හෝ විභාගයක දී අයදුම් පත්‍රයෙහි සඳහන් කරන ඕනෑම තොරතුරක් හෝ ඒ හා සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන වෙනත් ඕනෑම ලේඛණයක සඳහන් තොරතුරු අසත්‍ය හෝ

අසම්පූර්ණ හෝ වැරදි සහගත බව හැඟී ගියහොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීම, බලය පැවරීමේ සහතිකය අවලංගු කිරීම හා/හෝ අයදුම්කරුට/අවසර ලත් මුදල් තැරැව්කරණ සමාගමට මුදල් මණ්ඩලය විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන එවැනි වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයකට යටත් වීමට සිදුවනු ඇත.

8\. (අ) සෑම බලයලත් මුදල් තැරැව්කාර සමාගමක් විසින් ම මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරන ලද වාර්ෂික සහතික පත්‍ර ගාස්තුවක් සහ වෙනත් ඕනෑම ගාස්තු මහ බැංකුවට ගෙවිය යුතුය. — වාර්ෂික සහතික පත්‍ර ගාස්තු

(ආ) බලයලත් මුදල් තැරැව්කාර සමාගම් විසින් ගෙවිය යුතු ගාස්තු සහ අදාළ වෙනත් උපදෙස්, දේශීය කටයුතු අධ්‍යක්ෂ විසින් වරින් වර චක්‍රලේඛන මගින් ඔවුන්ට දැනුම් දෙනු ඇත.

9\. (අ) කිසියම් බලයලත් මුදල් තැරැව්කාර සමාගමක් තම ව්‍යාපාර කටයුතු අවසන් කිරීමට තීරණය කරන්නේ නම්, ව්‍යාපාරය අවසන් කිරීමට මාස තුනකට (03) පෙර ඒ පිළිබඳව දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. — මුදල් තැරැව්කාර ව්‍යාපාරය අවසන් කිරීම

(ආ) එවැනි මුදල් තැරැව්කාර සමාගම් විසින් තම ව්‍යාපාර කටයුතු අවසන් කළ දින සිට වැඩ කරන දින තුනක් (03) ඇතුළත මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද "බලය පැවරීමේ සහතිකය" ආපසු බාරදිය යුතුය.

10\. බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වලට පහත සඳහන් කටයුතුවල යෙදීමට අවසර ඇත. — අවසරලත් කටයුතු

(අ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් පිළිගත් ජාත්‍යන්තර මුදල් සහ විදේශ විනිමය වෙළඳපොළවල ගනුදෙනුකරුවන් සමග මූල්‍ය උපකරණ ගනුදෙනු සඳහා ඒජන්තවරයෙකු, පහසුකම් සලස්වන්නෙකු හෝ මැදිහත්කරුවෙකු ලෙස විදේශ විනිමය තැරැව්කරණය, අන්තර් බැංකු මුදල් තැරැව්කරණය ඇතුළත් මුදල් තැරැව්කරණ ව්‍යාපාර කටයුතුවල නිරත වීම ;

(ආ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමකට මුදල් මණ්ඩලය විසින් කලින් කලට බලය පවරන ලද මුදල් තැරැව්කරණය හා සම්බන්ධ ඕනෑම කටයුත්තක නිරත වීම.

11\. මුදල් තැරැව්කරණ ගනුදෙනුවල නිරත බලයලත් මුදල් තැරැව්කරණ සමාගමකට තැරැව් ගාස්තු, කොමිස් මුදල් හෝ සේවා ගාස්තු ලබා ගැනීමට හිමිකමක් ඇත. — තැරැව් කොමිස් සහ ගාස්තු

12\. බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් විසින් ඃ — මෙහෙයුම් අවශ්‍යතා

(අ) තැරැව්කරණ ගනුදෙනුවලට අදාළව ඒජන්තවරයෙකු, පහසුකම් සලස්වන්නෙකු හෝ මැදිහත්කරුවෙකු වශයෙන් පමණක් කටයුතු කළ යුතු අතර ප්‍රධානියෙකු ලෙස කටයුතු නොකළ යුතුය ;

(ආ) මාර්ගෝපදේශකත්ව ආචාර ධර්ම පද්ධතියක් ලෙස දේශීය කටයුතු අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ආචාර ධර්ම පද්ධතියක් පිළිගත යුතු අතර, දේශීය කටයුතු අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද එවැනි ආචාර ධර්ම පද්ධතියක් නොමැති අවස්ථාවක, ඒසීඅයි ආකෘති රීති සංග්‍රහය (ACI Model Code) පිළිගත යුතුය ;

(ඇ) ලැබෙන ඇණවුම්වල කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම, අදාළ මූල්‍ය උපකරණ සඳහා වූ නියමයන් සහ කොන්දේසි අධීක්ෂණය කිරීම සහ අපේක්ෂිත සහ අසම්පූර්ණ ගනුදෙනු වාර්තා තබා ගැනීම කළ යුතුය ;

(ඈ) මූලික ගිවිස ගැනීමේදී සහ ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට පෙර ගනුදෙනුවට පදනම් කරගන්නා වූ සුදුසුකම් ලබන කොන්දේසි (උදා ඃ ගනුදෙනුවට ගැලපෙන පාර්ශ්ව සොයාගැනීම) පැහැදිලිව සඳහන් කළ යුතුය ;

(ඉ) නිශ්චිත සහ පැහැදිලි විෂයබද්ධ පාරිභාෂික ශබ්දමාලාවක් යොදා ගනිමින්, සෑම විටම වෘත්තීයමය ආකාරයෙන් කටයුතු කළ යුතුය ;

(ඊ) එක් එක් ගිණුම් සඳහා සම්පූර්ණ සහ යාවත්කාලීන වූ වාර්තා පවත්වාගෙන යා යුතුය ;

(උ) නිශ්චිතවම ගනුදෙනුවක් කිරීම සඳහා දෙපාර්ශ්වයම සෑහීමකට පත්වීමෙන් පසු පමණක් ගනුදෙනුවට සම්බන්ධ ප්‍රධාන ගනුදෙනුකරුවන්ගේ නම් අනාවරණය කළ යුතුය ;

(ඌ) අනිකුත් ඕනෑම බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් සහ/හෝ ගනුදෙනුවෙහි නිරත අනිකුත් ඕනෑම පාර්ශ්වකරුවන් විසින් අවකල් ක්‍රියා සහ අයුතු ක්‍රියා සිදුකරන බවට ඕනෑම සංඥා/සාක්ෂි දැනගැනීමට ලැබුනහොත් ඒ පිළිබඳව දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය ;

(එ) අදාළ මූල්‍ය උපකරණයන් පිළිබඳව අවශ්‍යකරන මට්ටමේ දැනුමක් ලබාගත යුතු අතර එවැනි මූල්‍ය උපකරණ සහ වෙළෙඳපොළ තොරතුරුවලට අදාළ සැපයුම් හා ඉල්ලුම් ප්‍රභවයන් හා නියමයන් සහ කොන්දේසි පිළිබඳව පූර්ණ නිපුණතාවයකින් සහ අවබෝධයකින් යුක්ත විය යුතුය ;

(ඒ) අනෙකුත් පාර්ශවයන් සමග එදිනෙදා තොරතුරු හුවමාරු කර ගැනීමේදී, විදේශ විනිමය හා මුදල් වෙළඳපොළ ගනුදෙනු මත මහ බැංකුව මගින් නිකුත්කර ඇති රෙගුලාසිවලට අනුකූල විය යුතුය ;

(ඔ) සංවේදී තොරතුරු හඳුනා ගැනීමට සහ ඒවා පරිහරණය කිරිමට අවශ්‍යකරන කුසලතා හා දක්ෂතා පිළිබඳව ප්‍රමාණවත් පුහුණුවක් මෙහෙයුම් කාර්ය මණ්ඩලයට ලබාදිය යුතුය.

ප්‍රධාන නිලධරයන්ගේ යථා යෝග්‍ය බව

13. බලයලත් මුදල් තැරැව්කරණ සමාගම්වල ප්‍රධාන තනතුරු සඳහා පත්වන නිලධාරීන්, ප්‍රධාන විධායක නිලධරයා, අධ්‍යක්ෂ හෝ ප්‍රධාන කළමනාකරුට පමණක් සීමා නොවී ඔහුට හෝ ඇයට පැවරී ඇති වගකීම් මනාව ඉටුකිරීමට හැකියාවක් ඇති යථා යෝග්‍ය පුද්ගලයන් විය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය වන පළපුරුද්ද, සුදුසුකම් හා නිපුණතාවයන්ගෙන් ද යුක්ත විය යුතුය.

ප්‍රධාන නිලධරයකු වශයෙන් පත්කිරීමට නුසුදුසුකම්

14. බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස තෝරා ගැනීමට සහ/හෝ පත්කිරීමට හෝ එවැනි පුද්ගලයෙකු එවැනි තනතුරක් දැරීමට හෝ සුදුස්සෙක් නොවන්නේ එවැනි යම් පුද්ගලයෙකු :

(අ) මුදල් තැරැව්කාර කටයුතු, මූල්‍ය නීති, ව්‍යාපාර හෝ පරිපාලන කටයුතු හෝ ඒ හා සම්බන්ධ කිසියම් වෘත්තියක් පිළිබඳ අධ්‍යාපනික හෝ වෘත්තීයමය සුදුසුකම් හෝ එළදායී පළපුරුද්දක් ලබා නොමැති නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී යම් අධිකරණයකින් බුන්වත්භාවයෙන් නිදහස් නොකෙරෙනු තැනැත්තකු හෝ බුන්වත්භාවයට පත්වූ තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් ;

(ඇ) සදාචාර විරෝධී කටයුතු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරුවෙකු කර ඇත්නම් ;

(ඈ) යම් අධිකරණයක් විසින් ලබාදෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් ප්‍රකාරව ගෙවිය යුතු වූ ණය මුදලක් ගෙවීමට අපොහොසත් වී ඇත්නම් ;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසිය, යම් පාලන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදුකරන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වෙමින් සිටී නම් ;

(ඊ) එසේ පත්කරගනු ලැබීමට හෝ තෝරා පත්කරගනු ලැබීමට පෙර අවුරුදු පහළොවක කාලසීමාවක් ඇතුළත යම් අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් පාලන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් ඒ සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව වරදකරු කරනු ලැබ ඇත්නම් ;

(උ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පාලන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් යම් සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයෙකු, හෝ වෙනත් නිලධරයෙකු ලෙස සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබූ හෝ සේවය අත්හිටුවනු ලැබ ඇත්නම් ;

(උ) වංචාවක්, රැවටීමක් හෝ වංක ක්‍රියාවක් වන යම් ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක වරදකරුවෙකු ලෙස අධිකරණ ක්‍රියාමාර්ගයකට භාජනය වෙමින් සිටින්නෙකු නම් ;

(එ) නිසි අධිකරණ බලයක් සහිත අධිකරණයක් විසින් සිහි විකල් තැනැත්තෙකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති තැනැත්තෙකු නම් ;

(ඒ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුව හා/හෝ ප්‍රාථමික වෙළෙඳ ආයතනයක ප්‍රධාන විධායක නිලධරයෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් ඕනෑම බලතල සහිත නිලයක් දරන තැනැත්තෙකු නම්,

15. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා/හෝ ප්‍රාථමික අලෙවිකරුවෙකු විසින් බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක, කොටස් හෝ ස්කන්ධ නොදැරිය යුතු සේම, මුදල් තැරැව්කරණ සමාගමේ අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන නිලධාරීන් මගින් පාලනය අත්පත් කර ගැනීම නොකළ යුතුය. තැරැව්කරණ ව්‍යාපාරවල පාලනය අත්පත් කර ගැනීමේ සීමා

16. බලයලත් මුදල් තැරැව්කරණ සමාගම විසින් විදේශ විනිමය වෙළෙඳපොළ මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය කිරීමේදී : මිල ගණන් ලබාදීම

(අ) විනිමය අනුපාත වෙනස් කිරීම අරමුණු කරගත් මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය නොකළ යුතුය ;

(ආ) අවංකව ගනුදෙනු කිරීමට බලාපොරොත්තුවක් නොමැති සහ, වෙළෙඳපොළට සහභාගී වන්නන් නොමග යැවීමේ අදහසින් ප්‍රධාන හෝ බලයලත් පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය කිරීමෙන් වැළකී සිටිය යුතුය ;

(ඇ) පවතින වෙළෙඳපොළ මිල ගණන් සහ අන්තර් බැංකු කාලීන ගනුදෙනු මත පදනම් ව, විදේශ විනිමය හුවමාරු ගනුදෙනුවලට (FX swaps) අදාළ මිල ගණන් (මිල/අනුපාතය) සන්නිවේදනය කළ යුතුය.

17. පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම පිණිස සෑම බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් විසින්ම දැඩි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. අභ්‍යන්තර පාලනයේ අරමුණු

(අ) මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහ සඵලතාවය (මෙහෙයුම් අරමුණු) ;

(ආ) මූල්‍ය හා කළමනාකරණ තොරතුරුවල විශ්වසනීයත්වය සහ පරිපූර්ණ බව (තොරතුරුමය අරමුණු) ; සහ

(ඇ) යෝග්‍ය නීති සහ රෙගුලාසි සමග අනුකූලතාවය (අනුකූලතා අරමුණු).

18. ඉහත 17 වැනි රෙගුලාසියෙහි සඳහන් වන අභ්‍යන්තර පාලන පද්ධතියට අමතරව බලයලත් මුදල් තැරැව්කරුවන් විසින් : අභ්‍යන්තර පාලනය

(අ) අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රමවත්ව සමාලෝචනය කිරීම සහ/හෝ යාවත්කාලීන කිරීම කළ යුතු අතරම සියලුම මෙහෙයුම් කාර්ය මණ්ඩලය එම පද්ධතිය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව ඊට අනුකූලව කටයුතු කළ යුතු බවට සහතික විය යුතුය ;

(ආ) මෙම රෙගුලාසිවල අරමුණු සපුරා ගැනීම සඳහා, අවම වශයෙන් වසර තුනක (03) කාලයක් තුළ සියලු ගනුදෙනුවල විධිමත් වාර්තා, පැහැදිලි ලිඛිත සාක්ෂි ද සමග, විද්‍යුත් හෝ වෙනයම් ආකාරයකට පවත්වාගෙන යා යුතුය ;

(ඇ) ඉහත 10 වැනි රෙගුලාසියෙහි සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා පමණක් සම්බන්ධිත දුරකථන මාර්ග භාවිත කළ යුතුය ;

(ඈ) ඉහත 18(ඇ) වැනි රෙගුලාසියෙහි සඳහන් දුරකථන සංවාද වාර්තා (හඬ තැටි) එම දුරකථන සංවාද දිනයේ සිට මාස දෙකකට (02) නොඅඩු කාලයක් පවත්වාගෙන යා යුතුය ;

(ඉ) දුරකථන සංවාද වාර්තාවලට භෞතික ප්‍රවේශය සඳහා දැඩි පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය ;

(ඊ) සියලුම සේවා නියුක්තිකයන්හට මෙහෙයුම් පරිශ්‍රය තුළ පෞද්ගලික ජංගම දුරකථන භාවිතා කිරීම තහනම් කළ යුතුය.

තැරැව්කරණ තහවුරු කිරීම

19. (අ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක් විසින් ගනුදෙනුවක් සිදුවී විනාඩි විස්සක් (20) ඇතුළත සියලු ගනුදෙනු ලිඛිතව තහවුරු කළ යුතු අතර එම තහවුරුවක පහත සඳහන් අවම තොරතුරු ඇතුළත් විය යුතුය.

(i) ගනුදෙනුව සිදුවූ වේලාව, දිනය සහ එහි වලංගු දිනය ;
(ii) අදාළ ගනුදෙනුකාර පාර්ශ්වල නම් ;
(iii) පියවීම් උපදෙස් ; සහ
(iv) යෝග්‍ය බව, මුදල් තැරැව්කරණ සමාගම විසින් කොමිස් මුදලක් අය කරන ලද්දේ නම් එම මුදල ද ඇතුළුව අදාළ ගනුදෙනුවල සියලු තොරතුරු.

(ආ) ගනුදෙනුවේ නිරවද්‍යතාවය පිලිබඳව අදාළ ගනුදෙනුව ආරම්භ කළ පාර්ශ්වයන් සමඟ ස්වාධීනව සිදුකරන ලද සියුම් පරීක්ෂණයකින් අනතුරුව පසු මෙහෙයුම් (back office) අංශය විසින් තැරැව්කරණ තහවුරුව යැවිය යුතුය.

වාර්තා කිරීමේ අවශ්‍යතාවය

20. බලයලත් මුදල් තැරැව්කරණ සමාගම විසින් මාසික කාර්ය සාධන වාර්තාවක්, අදාළ මාසයට පසු එළඹෙන මස වැඩ කරන දින 5කට නොඅඩු කාලයක් තුළ, මේ සමග අමුණා ඇති "උපලේඛන අ" හි සඳහන් පරිදි, දේශීය කටයුතු අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල මගින් ලැබීමට සැලැස්විය යුතුය.

ගිණුම් හා අනෙකුත් වාර්තා පරීක්ෂා කිරීම

21. දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ඔහුගේ දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් බලයලත් මුදල් තැරැව්කරණ සමාගමක ගිණුම් හා අනෙකුත් වාර්තා/ක්‍රියාකාරකම්, ඕනෑම අවස්ථාවක පරීක්ෂා කර බලනු ඇත. එවැනි පරීක්ෂාවකට පහසුකම් සළසනු පිණිස, දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් හෝ ඔහු බලය පවරන ලද නිලධරයෙකු විසින් හෝ යම් තොරතුරක් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අවසරලත් මුදල් තැරැව්කරණ සමාගම විසින් එම තොරතුරු සැපයිය යුතුය.

මෙම රෙගුලාසිවලට අනුකූල වීමට අසමත්වීම

22. මෙම රෙගුලාසි ප්‍රකාර විධිවිධානවලට අවනත වීමට අසමත් වීම හා/හෝ සාවද්‍ය හෝ ව්‍යාජ තොරතුරු ලබාදීම හෝ කිසියම් වැදගත් තොරතුරු සැපයීම පැහැර හැර ඇති විටක, විමර්ශනයකින් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් පහත කරුණු ද ඇතුළත් වූ දඬුවම් ක්‍රියාමාර්ගයක් ගනු ඇත.

(අ) එවැනි බලයලත් මුදල් තැරැව්කරණ සමාගමට දැඩි ලෙස අවවාද කිරීම ;

(ආ) බලයලත් මුදල් තැරැව්කරණ සමාගම 10 වැනි රෙගුලාසියේ සඳහන් ඇතැම් මුදල් තැරැව්කරණ ක්‍රියාකාරකම්වල නියැලීමට නුසුදුස්සකු කිරීම ;

(ඇ) මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද බලය පැවරීමේ සහතිකය අහෝසි කිරීම/ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

අර්ථ නිරූපන

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ රෙගුලාසිවල-

(අ) "ඒසීඅයි ආකෘති රීති සංග්‍රහය" යන්නෙන් අදහස් විය යුත්තේ කැම්බිස්ට් ඉන්ටර්නැෂනල් සංගමය (ACI) නොහොත් මූල්‍ය වෙළෙඳපොළ සංගමය විසින් සම්මත කරන ලද ස්වයං පාලන ආචාර ධර්ම පද්ධතියයි ;

(ආ) "බලයලත් මුදල් තැරැව්කරණ සමාගම" යන්නෙන් අදහස් විය යුත්තේ මෙම රෙගුලාසි යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද බලය පැවරීමේ සහතිකය දරනු ලබන සමාගමකි ;

(ඇ) "මුදල් මණ්ඩලය " යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනත (422 අධිකාරය) යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයයි ;

(ඈ) "බලය පැවරීමේ සහතිකය" යන්නෙන් අදහස් වන්නේ මෙම රෙගුලාසි යටතේ මුදල් තැරැව්කාර ක්‍රියාකාරකම්හි නියැලීමට මුදල් මණ්ඩලය විසින් යම් සමාගමකට ලබාදී ඇති අවසර පත්‍රයයි ;

(ඉ) "සේවාදායකයින් " යන්නෙන් අදහස් විය යුත්තේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා අනාගතයේ දී විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා අවසර ලබාදී ඇති ඕනෑම ආයතනයක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ප්‍රාථමික ගනුදෙනුකරුවන්, මූල්‍ය කළමනාකරණ ආයතන, විශ්‍රාම අරමුදල්, ඒකක භාර සමාගම්, රක්ෂණ සමාගම්, ආයතනික භාණ්ඩාගාරයන්, රජයේ ආයතන හා මහ බැංකුව විසින් පිළිගත් අනෙකුත් මූල්‍ය ආයතනයන් ය ;

(ඊ) "සමාගම" යන්නෙන් අදහස් විය යුත්තේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත පොදු හෝ පුද්ගලික සමාගමක් ලෙස ස්ථාපිත කර ලියාපදිංචි කරන ලද සමාගමකි ;

(උ) "අධ්‍යක්ෂ, දේශීය කටයුතු " යන්නෙන් අදහස් විය යුත්තේ මුදල් නීති පනත (422 අධිකාරය) යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාය ;

(ඌ) "මූල්‍ය උපකරණ' යන්නෙන් අදහස් විය යුත්තේ දේශීය හා විදේශීය තොග මුදල් බැංකු තැන්පත්, එතැන් සහ ඉදිරි විදේශ විනිමය (ශ්‍රී ලංකා රුපියලට එරෙහි ඕනෑම මුදලක් සහ ස්ථිර හරස් මුදල් සහ හුවමාරු ගනුදෙනු), විදේශ විනිමය හුවමාරු ගනුදෙනු, පොලී අනුපාතික හුවමාරු ගනුදෙනු, මුදල් විකල්ප සහ ඉදිරි ගනුදෙනු, රජයේ හා ආයතනික බැඳුම්කර ඇතුලු ස්ථිර ආදායම් සුරැකුම්පත්, ප්‍රති මිලදී ගැනුම් හා ප්‍රති විකුණුම් ගිවිසුම්, ඒක්ෂණ මුදල් හා කාලීන මුදල්, ණයකර, වාණිජ පත්‍ර, පොරොන්දු නෝට්ටු, සුරැකුම්කරණය, එවැනි උපකරණවල කිසියම් සංයෝගයක් හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම මූල්‍ය උපකරණයන්ය ;

(එ) "අභ්‍යන්තර පාලන පද්ධතිය " යන්නෙන් අදහස් විය යුත්තේ සමාගමේ ව්‍යාපාර කටයුතු ක්‍රමවත් සහ ඵලදායී ලෙස කරගෙන කළමනාකරණ ප්‍රතිපත්තිවලට අනුකූලබව සහතික කිරීම, වත්කම් ආරක්ෂා කිරීමට සහ හැකිතාක් දුරට වාර්තාවල පරිපූර්ණත්වය හා නිරවද්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ස්ථාපිත කරනු ලබන මූල්‍යමය හෝ වෙනත් සම්පූර්ණ පාලන පද්ධතියකි ;

(ඒ) "ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය" යන්නෙන් අදහස් විය යුත්තේ එම ආයතනයේ ඕනෑම අධ්‍යක්ෂවරයෙක් (විධායක හෝ වෙනත්) ඇතුලු ඍජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීමේ බලතල හා වගකීම සහිත පුද්ගලයන්ය ;

(ඔ) "මුදල් තැරැව්කරණය" යන්නෙන් අදහස් විය යුත්තේ ගෙවූ හෝ ගෙවීමට නියමිත තැරැව් ගාස්තු හෝ කොමිස් මුදලක් සැලකිල්ලට ගනිමින් අතරමැදියෙක් ලෙස කටයුතු කරමින් මුදල් හා විදේශ විනිමය වෙළෙඳපොල තුළ ගැනුම්කරු සහ විකුණුම්කරු අතර ගනුදෙනු පිළියෙල කිරීමේ නිරත වන ව්‍යාපාරයකි ;

(ඕ) "නිර්-විරෝධතා ලිපිය" යන්නෙන් අදහස් විය යුත්තේ දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් (හෝ ලිපිය නිකුත් කරනු ලැබුවේ 2002 ජනවාරි 01 වැනි දිනට ප්‍රථම නම් ප්‍රධාන ගණකාධිකාරී විසින්) ශ්‍රී ලංකාවේ මුදල් හා විදේශ විනිමය වෙළඳපොළ තුළ තැරැව්කාර ක්‍රියාකාරකම් කරගෙන යාම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විරෝධතාවයක් නොමැති බව සඳහන් කරමින් මෙම රෙගුලාසි බලපැවැත්වෙන දිනය වන විටත් මුදල් තැරැව්කාර ව්‍යාපාරය තුළ කටයුතු කරන ආයතනවලට නිකුත් කරනු ලැබූ ලිපියයි ;

(ක) "මෙහෙයුම් කාර්ය මණ්ඩලය" යන්නෙන් අදහස් විය යුත්තේ 10 වැනි රෙගුලාසිය යටතේ සඳහන් කර ඇති මෙහෙයුම්වල ඍජුවම නියැලෙන, බලයලත් මුදල් තැරැව්කාර ආයතනයේ සේවකයන් ය ;

(ග) "ප්‍රාථමික වෙළෙන්දා" යන්නෙන් අදහස් විය යුත්තේ 1937 අංක 7 දරන ලියාපදිංචි ව්‍යාපාර වස්තු හා සුරැකුම්පත් ආඥා පනතෙහි නිර්වචනය කර ඇති ආකාරයටයි ;

(ච) "ප්‍රධානියා" (Principal) යන්නෙන් අදහස් විය යුත්තේ තමන් විසින්ම අවදානම දරමින් මිලට දීම හා මිලදී ගැනීම සිදු කරන ගැනුම්කරු හෝ විකුණුම්කරු වශයෙන් ක්‍රියාකරන ගනුදෙනුවේ පාර්ශ්ව කරුවෙකි ;

(ඡ) "සුරැකුම්පත් " යන්නෙන් අදහස් විය යුත්තේ ණය සුරැකුම්පත් සහ ව්‍යුත්පන්න ගිවිසුම් ඇතුලුව ගනුදෙනු කළ හැකි මූල්‍ය වටිනාකමක් සහිත මූල්‍ය උපකරණයන්ය ;

(ට) "ප්‍රකාශ කළ ප්‍රාග්ධනය" යන්නෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ ඒ සඳහා දී ඇති සමාන අර්ථය අදහස් වේ ;

(ඩ) "සම්බන්ධිත දුරකථන මාර්ග' යන්නෙන් අදහස් විය යුත්තේ බලයලත් මුදල් තැරැව්කරුවා හා අදාළ ප්‍රධානියා අතර පවත්නා අන්තර් සන්නිවේදනය සඳහා වන සන්නිවේදන සම්බන්ධතාවයයි.

## 'අ' උපලේඛනය

මුදල් තැරැව්කාර සමාගමේ නම :.................................................................................................

කාල පරිච්ඡේදය :.................................................................................................

| | ගනුදෙනු ප්‍රමාණය * (මුහුණත වටිනාකම) | | ආදායම | |
|---|---|---|---|---|
| | එ. ජ. ඩො. අගය | රුපියල් | එ. ජ. ඩො. අගය | රුපියල් |
| විදේශ විනිමය ගනුදෙනු | | | | |
| එ.ජ.ඩො./රුපියල් ස්ථිර පදනමක් මත ගනුදෙනු | | | | |
| විදේශ විනිමය හුවමාරු ගනුදෙනු | | | | |
| හරස් විනිමය | | | | |
| තැන්පතු | | | | |
| | | | | |
| අන්තර් බැංකු ගනුදෙනු | | | | |
| ඒක්ෂණ මුදල් | | | | |
| කාලීන මුදල් | | | | |
| | | | | |
| රජයේ සුරැකුම්පත් | | | | |
| ස්ථිර පදනමක් මත ගනුදෙනු | | | | |
| ප්‍රතිමිලදී ගැනීම/ප්‍රතිවිකුණුම් | | | | |
| සේවා (වාණිජ පත්‍ර) | | | | |
| වෙනත් | | | | |

*කරුණාකර ගනුදෙනුවක එක් පාර්ශ්වයක් පමණක් සැලකිල්ලට ගන්න - විකිණීම හෝ මිලදී ගැනීම

වෙනත් තොරතුරු :

(අ) ප්‍රාග්ධන සහ සංචිත :
(ආ) බදු අය කිරීමෙන් පසු ලාභය :
(ඇ) සේවක සංඛ්‍යාව :
(ඈ) ප්‍රධාන නිලධාරීන් :
(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය :

02-819

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.